# බස්නාහිර පළාත්සභා මැතිවරණය හා විජාතික බලපෑම්

බස්නාහිර පළාත්සභා මැතිවරණයෙන් එක්සත් ජනතා නිදහස් සංධානය විශිෂ්ට ජයක් ලබාගත්තේ ය. ඇතැම් මැතිවරණ දිස්ත්‍රික්කවල (ආසනවල) සංධානය ලබාගත් ඡන්ද ප්‍රමාණය සියයට හැත්තෑපහක් පමණ විය. ඡන්දයෙන් පත්වූ මන්ත්‍රීවරුන්ගෙන් තුනෙන් දෙකකට ආසන්න ප්‍රමාණයක් මන්ත්‍රීවරු සංධානයෙන් නාම යෝජනා ලැබුවෝ වූහ. එ ජා ප පක්ෂයේ මන්ත්‍රීවරයකුට අනුව නම් සංධානයට ලැබී ඇත්තේ ලියා පදිංචි ඡන්ද සංඛ්‍යාවෙන් සියයට තිස්නවයක් පමණ බැවින් සංධානය පරාද වී ඇත. මැතිවරණයකදී පක්ෂයක් ලැබූ ඡන්ද ප්‍රතිශතය ගණනය කරන්නේ ලියාපදිංචි සංඛ්‍යාවට සාපේක්ෂව නොවන බව ඒ මහතා සමහරවිට නොදැන සිටියා විය හැකි ය. එ ජා ප ලබාගෙන ඇත්තේ සියයට දහඅටක පමණ ප්‍රතිශතයක් නිසා එතුමාගේ තර්කය අනුව එ ජා පක්ෂයට ලැබී ඇත්තේ අන්ත පරාජයකි.

ඡන්දය නොදුන් අයගෙන් කොපමණ ප්‍රතිශතයක් සංධානයට ඡන්දය දෙනු ඇත්දැයි දැනගැනීමට ක්‍රමවේදයක් නැත. මිනිසුන්ගේ සිත් කියවීමෙන් හැර වෙනත් අයුරකින්  ඒ නිශ්චිතව දැනගත හැකි යැයි නො සිතමි. එහෙත් ඉහත සඳහන් එ ජා ප මන්ත්‍රීවරයාට අන් අයගේ සිත් කියවීමේ හැකියාව ඇති බව දැනගැනීමට නැත.  එබැවින් ඔහුගේ නිගමනය තහවුරු කිරීමට නොහැකි වචන කිහිපයක් පමණකි. ඡන්දය නොදුන් අයගෙන් ද ඡන්දය දුන් අයගේ වැනිම ප්‍රතිශතයක් ඒ ඒ පක්ෂවලට ලැබෙන්නට තිබිණි යැයි කිසිවකුට උපකල්පනය කළහැකි වුව ද එහි එතරම් වැදගත් කමක් ඇතැයි සිතිය නො හැකි. මෙහි දී කිවයුත්තක් වෙයි. ඒ ඡන්දය නොදීම හා විරුද්ධව ඡන්දය දීම යනු එකක් නොව දෙකක් බව ය.  ඡන්දය නොදෙන්නන් අතර මියගිය අයට අමතරව විරුද්ධවන්නන් ද පක්ෂවන්නන් ද හිතහදාගැනීමට නොහැකි වූවන් ද ආදී වශයෙන් විවිධ වර්ගවලට අයත්වූවෝ වෙති.

අනෙක් අතට ලංකාවේ ඡන්දය දීම පිළිබඳව සමීක්ෂණ කිරීමෙන් අපට නිශ්චිතව යමක් දැනගැනීමට නොහැකි ය. මේ සමීක්ෂණවලින් විශ්වාස කළහැකි නිගමන ලැබේ යැයි සිතිය නො හැකි ය. මෙරට සාමාන්‍ය ජනයා අදාළ ප්‍රශ්නාවලිවලට පිළිතුරු දෙන්නේ හැකි පමණින් ප්‍රශ්න අසන්නා සතුටුවන ආකාරයට ය. ප්‍රශ්න අසන්නාට අවශ්‍ය පිළිතුර ඉවෙන් මෙන් දැනගැනීමට මෙරට ජනතාව බොහෝ විට සමත් වෙති. ඒ කුමක් වුවත් එ ජා පක්ෂයට අනාගත මැතිවරණයක දී ජයගැනීමට අවශ්‍ය නම් කළ යුත්තේ මෙවර මැතිවරණයෙන් ඒ පක්ෂය ජයගෙන නැති බව පිළිගැනීම ය. එසේ නැතිව සංධානය පැරදී ඇති බවට තර්ක ඉදිරිපත්කිරීමෙන් වන්නේ තමන්ට ජයගැනීමට මහන්සිවීම අනවශ්‍ය බව පිළිගැනීම ය. තම වැරදී නිවැරදි කර නොගෙන නැවතත් ඡන්දයකට ඉදිරිපත් වී අවසානයේ දී කිරීමට සිදුවන්නේ නැවතත් සංධානය පැරදී ඇති බවට බොරු තර්ක ඉදිරිපත්කිරීම පමණ ය.

කොළඹ නාගරික සභා සීමාවේ ආසන පමණක් ජයගැනීමට එ ජා ප සමත් වී ඇත. එහෙත් එහි දී පවා සංධානය තම ඡන්ද ප්‍රතිශත වැඩිකරගෙන ඇත.  ඒ කෙසේ වෙතත් මේ ප්‍රතිඵලවලින් පෙන්නුම් කරන්නේ කොළඹ යනු ලංකාව නොවන බව ය. කොළඹ නගර සභා සීමාවේ ජන ප්‍රතිශතවලින් වැඩිම ප්‍රතිශතය මුස්ලිම් ය. සිංහල ප්‍රතිශතය සමහර විට තුන්වැනි තැන ගන්නවා විය හැකි ය. එසේ තිබිය දී ද සංධානයට මුස්ලිම් හා දෙමල  ඡන්ද ගියවරට වඩා ලැබී ඇති බව පැහැදිලි ය. එමෙන් ම කිවයුතු තවත් වැදගත් කරුණක් නම් ගම්පහ දිස්ත්‍රික්කයේ කතෝලික ආසවල ද ජයග්‍රහණය සංධානය හිමිකරගෙන ඇති බව ය. මෙයින් පැහැදිලි වන කරුණ නම් ඇතැම් පූජකවරුන් හා ක්‍රිස්තියානි හා කතෝලික ප්‍රබුද්ධයන් සිංහල බෞද්ධ සංස්කෘතිය පාගාදැමීමට කටයුතු කළ ද සාමාන්‍ය සිංහල කතෝලිකයන්ට එවැනි අවශ්‍යතාවක් නැති බව ය.

සංධානයට විරුද්ධවන්නේ කසිකබල් මාක්ස්වාදීන් ඊනියා ලිබරල්වාදීන් හා දෙමළ ජාතිවාදීන් බව පැහැදිලි ය. මේ පිරිස නැගෙනහිර කොළඹ බටහිර කොළඹ බොරැල්ල ආදී ප්‍රදේශවල වැඩි වශයෙන් ගැවසෙති. උතුරු කොළඹ හා මැද කොළඹ සංධානයට ජයගත නොහැකිවුවත් ලබාගත් ඡන්ද ප්‍රතිශතය වැඩි වී ඇත. රට පටන් ගන්නේ කොළඹ අවසන් වූ තැන ය. විදේශවලින් කොළඹට පැමිණ ඉහත කී මාක්ස්වාදීන් ලිබරල්වාදීන් හමු වී කතා කර ආපසු ගොස් පඩි වාර්තා ලියන විජාතික බලවේගවල ඇතැම් සාමාජිකයෝ හා නියෝජිතයෝ ඒ බවක් නොදනිති. අනෙක් පිරිස ඒ බව දැන දැනත් තමන්ට අවශ්‍ය ආකාරයට ලෝකය හැසිරවීම සඳහා කොළඹ ජීවත්වන ව්‍යාජ පඩියන් සාක්ෂියට කැඳවති.

© Prof. Nalin De Silva

වික්‍රමබාහු බණ්ඩාර කරුණාරත්න මහතාගේ පක්ෂයට ලැබී ඇත්තේ ඉතා සුළු ඡන්ද ප්‍රමාණයකි. මෙරට සිටින කසිකබල් මාක්ස්වාදීන්, පශ්චාත් මාක්ස්වාදීන්, පශ්චාත් නූතනවාදීන් ආදීන්ට අද එකතුවීමට ඇත්තේ සතිඅන්ත කසිකබල් පුවත්පතක් හා කරුණාරත්න මහතාගේ වැනි පක්ෂයක් වටා පමණ ය. එකී පුවත්පතේ කතුවරයා ද දෙමළ ජාතිවාදය පිළිබඳව දැන් තම අදහස් වෙනස්කරගෙන ඇත. එහෙත් ඔහු ද තවමත් දෙමළ ජනයාට සිදු වී ඇති ඊනියා අසාධාරණකම් ගැන විටින් විට කතාකරයි. ණැගෙනහිර පළාතේ ජනසංයුතිය ගැන හෝ ලකුණු ප්‍රමිතිකිරීම යනු කුමක් දැයි තමන් නොදන්නා බව දැනට අවුරුදු පහළොවකට පමණ පෙර රටට හෙළිකළ මොහු තවමත් ඒ පිළිබඳ කතාකරන්නේ අපෝහකය ගැන හාන්කවිසියක්වත් නොදැන අපෝහක විධික්‍රමයක් ගැන කතාකරන පඬියන් මෙනි. මේ සියළු දෙනාට රටේ කිසිම බලයක් ප්‍රසාදයක් නොමැති වුවත් ජඩමාධ්‍යයේ පිහිටෙන් දේශපාලන වේදිකාවක් ලැබී ඇත. ජ වි පෙරමුණ මන්ත්‍රිවරු තුන්දෙනකුට පමනක් සීමා වී ඇත. අප සැමදාමත් කියා ඇත්තේ අයාලේ ගිය ද පනස්හයේ දරුවන් වූ මොවුන්ට ශක්තියක් ලැබෙන්නේ අනෙක් පනස්හයේ දරුවන් සමග එකතු වූ විට පමණක් බව ය. ඒ බව වටහාගැනීමට ඔවුන්ට නොහැකි වී ඇත්තේ කසිකබල් මාක්ස්වාදය තවමත් ඔවුන්ගේ සිත්වල හොල්මන් කරන බැවින් ය.

පසුගිය කාලයේ පැවැත්වූ අනෙක් සියළු පළාත්සභා මැතිවරණ මෙන් ම බස්නාහිර පළාත්සභා මැතිවරණය ද මානුෂික මෙහෙයුම් පිළිබඳ ජනමතවිචාරණයක් විය. ජනතාව ඉතා වැඩි ඡන්ද ප්‍රමාණයකින් දෙමළ ත්‍රස්තවාදයට එරෙහිව ඒකීය ලංකාවක් හා රටේ ස්වෛරීභාවය වෙනුවෙන් කරන මෙහෙයුම් අනුමත කර ඇත. එහෙත් මේ ජනමතය අවලංගු කිරීමට තැත්කරන පිරිසක් වෙයි. ඒ දේශීය හා විදේශීය විජාතික බලවේගය ය. කොළඹ නාගරික සභා සීමාවෙහි වැඩිපුර ඇත්තේ ද මේ විජාතික බලවේගවලට යම් අයුරකින් සම්බන්ධ වූවන් ය.

අපේ ප්‍රධාන සතුරා වූ බ්‍රිතානිය ඉතා සියුම් ක්‍රියාමාර්ග ඔස්සේ ආණ්ඩුව අස්ථාවර කිරීමට කටයුතු කරන බව පැහැදිලි ය. පළාත්සභා මැතිවරණවලින් ආණ්ඩු පක්ෂයට ලැබුණු ජය නිශ්ක්‍රීය කිරීමේ අවශ්‍යතාව ඔවුන්ට වෙයි. ඔවුන්ට අවශ්‍ය රනිල් වික්‍රමසිංහ මහතා බලයට පත්කර සිංහල බෞද්ධ සංස්කෘතිය දුර්වල කිරීමය. අවුරුදු දෙසීයකට වැඩි කාලයක් තිස්සේ ඔවුන් කරමින් සිටින්නේ ඒ කාර්ය ය. බ්‍රිතානි විදේශ ඇමති මිලිබෑන්ඩ් තම ප්‍රංශ සගයාත් සමග තකහනියක් ලංකාවට පැමිණියේ ලංකාණ්ඩුවේ හුදු ආරාධනයකින් ප්‍රභාකරන් විසින් කොටුකරගෙන සිටි දෙමළ ජනයාගේ දුක සැප බැලීමට යැයි අපි කිසිසේත් නො සිතමු. බටහිරයන් ආණ්ඩුව ලවා තමන්ට ආරාධනයක් කරවාගෙන ඇති බව පැහැදිලි ය. බටහිර ප්‍රධාන රටවල් දෙකක විදේශ ඇමතිවරුන් දෙදෙනකු එකවර ලංකාවට පැමිණ ඇත්තේ හැකිනම් ආණ්ඩුවේ ක්‍රියාමාර්ගයට තිරිංග යෙදීමට බව පැහැදිලි ය.

ප්‍රභාකරන් තවමත් ලංකාවේ සිටි ද නැත්ද යන්න ගැන අපට මේ අවස්ථාවේ දී නිශ්චිතව යමක් කිව නොහැකි ය. ඔහු ලංකාවේ කොටු වී ඇත්නම් ඉහත කී බලවතුන් දෙදෙනා මෙන් ම වෙනත් බටහිරයන් ද ලංකාවට පැමිණෙන්නේ ත්‍රස්තවාදී නායකයා බේරා ගැනීමට ය. ප්‍රභාකරන් ලංකාවේ නොමැති නම් ඔවුන් ඇවිත් යන්නේ එක් පැත්තකින් ඊනියා බලය බෙදීම ගැන බලපෑම් කිරීමට ය. අනෙක් පැත්තෙන් බටහිර රටවල කලබල කරන දෙමළ ජාතිවාදීන් බොරුවට සැනසීමට ය. බ්‍රිතානීන් ප්‍රධාන බටහිරයන්ගේ නිර්මාණයක් වූ මේ දෙමළ ජාතිවාදීහු අද ප්‍රභාකරන් ලංකාවේ කොටු වී ඇතැයි යන මතය දරති. ඔවුන් බටහිරයන්ට බලකරන්නේ කෙසේ හෝ ප්‍රභාකරන් බේරා ගැනීමට ය. ඔවුන් ඒ රටවල ලංකාවේ හා ඉන්දියාවේ තානාපති කාර්යාලවලට පහර දෙන්නේ ද ඒ සඳහා ය. බටහිරයන්ට කොටි පරාද වීමෙන් පසුව සිංහල බෞද්ධ සංස්කෘතියට විරුද්ධව යොදාගැනීමට ඇති ප්‍රධාන පිරිසද මොවුහු වෙති. ප්‍රභාකරන් දැනටමත් ලංකාවෙන් පිටවී ඇත්නම් හෝ අද හෙට පිටවී ගියහොත් හෝ බටහිරයන් මේ පිරිස මුල්කරගෙන ප්‍රභාකරන් යටතේ මුහුදින් එතෙර ඊළමක් පිහිටුවීමට කටයුතු කරනු ඇත. ඒ කුමක් වුවත් ආන්ඩුව මොවුන් ඉදිරියේ දණ නොනැමිය යුතු ය. අවුරුදු පන්සියයකට පසුව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අද කණකොකා හඬා ඇත. ඉතිහාසයේ වේදිකාවෙන් බැස යෑමට නියමිත මොවුන්ට බිය වී බහුතර ජනමතය ප්‍රතික්ෂේප කර අප අපේ ස්වෛරීභාවය නැතිකර නොගත යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva